**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2017**

**-----------------------------------------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ  මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී  ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්  අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ලැබිය යුතු ගිණුම්

විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයවිය යුතු එකතුව රු. 10,650 ක් වූ උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැනගැනීමත් එයට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කර ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් අවස්ථා 03 ක දී එසේ කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 3,825,746 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 214,709 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,040,455 ක පිරිහීමක් ඇති වී තිබුණි. සේවක පිරිවැය රු.37,708,090 කින් හා සේවා පිරිවැය රු. 13,346,754 කින් වැඩිවී තිබීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.3,123,062 ක් වූ අතිරික්තය 2017 වර්ෂය වනවිට රු.3,825,746 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේ දී 2013 වර්ෂයේ දී රු. 158,465,726 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු. 267,711,572 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුළ දී කළයුතු මිලදී ගැනීම් හා ඉදිකිරීම් දක්වමින් වර්ෂය ආරම්භයේ දී පිළියෙළ කර අනුමත කර තිබූ ප්‍රසම්පාදන සැලසුම සමාලෝචිත වර්ෂය අවසානයේ සංශෝධනය කර තිබුණෙන් විශ්ව විද්‍යාලය සිය අවශ්‍යතාවය හඳුනා නොගෙන ප්‍රසම්පාදන සැලසුම නිසි ලෙස පිළියෙළ කර නොතිබූ බවත් එය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

-----------------------------------

(අ) අරමුණු ඉටුකර ගැනීමට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලය විසින් දැනට පවත්වනු ලබන උපාධි පාඨමාලා 13 ක් හා ඩිප්ලෝමා පාඨමාලා 11 ක් අතුරින් උපාධි පාඨමාලා 03 ක් හා ඩිප්ලෝමා පාඨමාලා 02 ක් පමණක් ප්‍රතීතනය කර තිබුණි.

(ii) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතෙහි 21(I) වගන්තියට අනුව ඇතුළත් කිරීම, ප්‍රතීතනය කිරීම සහ තත්ත්ව සහතික කිරීමේ සභාවක් පිහිටුවා තිබූ අතර එම සභාවේ 2010 මැයි 18 දිනැති තීරණය ප්‍රකාරව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් හා අනෙකුත් පාඨමාලා සඳහා මොරටුව, පේරාදෙණිය හා කොළඹ විශ්වවිද්‍යාල මගින් ප්‍රතීතනයන් ලබා ගැනීමටත් ඊට අමතරව විදේශීය පිළිගත් විශ්වවිද්‍යාලවලින් ප්‍රතීතනයන් ලබාගැනීමටත් තීරණය කර තිබුණි. මේ වනවිට විශ්වවිද්‍යාලය පිහිටුවා වර්ෂ 08 ක් ගතව තිබුණද අපේක්ෂිත මට්ටමට උපාධි පාඨමාලා ප්‍රතීතනය කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය පවත්වනු ලබන උපාධි පාඨමාලා 09 කට අදාලව 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය තුළ ලියාපදිංචි වූ සිසුන්ගේ පළමුවරට විභාග සමත්වීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවති අතර සමත්වීමේ ප්‍රතිශතය සියයට 19 සිට සියයට 57 ක පරාසයක පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ගෙන ගොස් තිබුණද, 2017 වර්ෂයේ දී එක් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා පමණක් සිසුන් ලියාපදිංචි කරවාගෙන තිබුණි. එහෙත් එවැනි පාඨමාලා නොපැවැත්වීමට අදාලව ගන්නා ලද තීරණ විගණනයට ඉදිරිපත් නොකෙරිණි. පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලාවල සිසුන්ගේ සමත්වීම ද අවම මට්ටමක පැවති අතර එම පාඨමාලා අවසන් කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය.

(ඈ) නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------------------------

වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක වන නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ 2017 වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව මූලික ක්‍රියාකාරකම් 10 ක් යටතේ උප ක්‍රියාකාරකම් 22 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 290.7 ක් වෙන් කර තිබුණු අතර විශ්වවිද්‍යාලය ඉන් ක්‍රියාකාරකම් 18 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 140.55 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුල වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි පවත්නා කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවිය යුතු වුවද විශ්ව විද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ හා ද්විතීය මට්ටමේ පුරප්පාඩු 04 බැගින් පැවති අතර විශ්වවිද්‍යාල විද්‍යායතනයන් 06 සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු ලෙස කථිකාචාර්ය 35 ක්, ප්‍රදර්ශක 21 ක් හා උපදේශක 01 ක් ද අනධ්‍යයන පුරප්පාඩු 28ක්ද පැවති බව නිරීක්ෂණය විය.

(ii) ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීම සඳහා රු. මිලියන 07 ක් වෙන් කර තිබුණද එම අරමුදල් උපයෝජනය කර අදාල කාර්යය ඉටු කර නොතිබුණි.

(iii) විශ්වවිද්‍යාල විද්‍යායතන 6 හි ආබාධිත පුද්ගලයින් සඳහා පහසුකම් සැපයීම හා වීඩියෝ සම්මන්ත්‍රණ පද්ධතියක් පිහිටුවීම සඳහා රු. මිලියන 120 ක් වෙන් කර තිබුණු අතර ඉන් රු. මිලියන 74.02 ක් වියදම් කර තිබුණ ද අදාල කාර්යය ඉටු කර නොතිබුණි.

(iv) හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්ට අදාලව උපාධි මෙහෙයවීම හා පිළිගත් විශ්වවිද්‍යාලවලින් විෂයමාලා සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ ලබාගැනීම විශ්වවිද්‍යාලය හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්ට අදාලව නව උපාධි 2 ක් හඳුන්වාදීම සඳහා රු.මිලියන 1 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද, විගණිත දිනය වූ 2017 මැයි 21 දින දක්වා එවැනි උපාධි පාඨමාලා ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වුව ද, 2016 වර්ෂයේ දී එක් උපාධි පාඨමාලාවක් සඳහා පමණක් විෂයමාලා සකස් කර තිබුණු අතර එක් උපාධි වැඩසටහනක් සඳහා 2016 වර්ෂයේ සිට කථිකාචාර්යවරයෙකු ද බඳවා ගෙන තිබුණි. වර්ෂය තුළ ප්‍රතිපාදිත මුදලින් රු. මිලියන 0.05 ක් වියදම් කර තිබුණු අතර ඒ කුමන කාර්යයකටද යන්න විගණනයට පැහැදිලි නොකෙරිණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආගන්තුක සත්කාර උපාධි පාඨමාලාව සඳහා 2016 ජුනි 15 දින සිට විදේශ උපාධියක් හිමි කථිකාචාර්යවරියක් බඳවාගෙන තිබුණ ද, 2018 මැයි 21 විගණිත දිනය දක්වා එම උපාධි පාඨමාලාව ආරම්භ කර නොතිබුණි. බඳවාගත් දින සිට ඉහත නිලධාරිනිය වෙත වැටුප් හා දීමනා ලෙස රු. 2,464,214 ක් ගෙවීම් කර තිබුණද අරමුණුගත කාර්ය ඉටු වී නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ සහකාර මූල්‍යාධිකාරිවරයෙකු ලෙස සේවය කළ නිලධාරියෙකු 2012 අප්‍රේල් 05 දින සේවය හැර ගොස් තිබුණු අතර ඔහුගෙන් අයවිය යුතු එකතුව රු.763,176 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට යැවිය යුතු අර්ධ වාර්ෂික වාර්තා ප්‍රමාද කිරීම හේතුවෙන් ආයතනයට ගෙවීමට සිදු වූ රු. 589,164 ක් වූ අධිභාර මුදල ගණකාධිකාරීගෙන් හා හිටපු අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අයකරගැනීම සඳහා නීති ප්‍රකාරව කටයුතු කිරීමට 2012 ජුනි 22 දිනැති මූලික විමර්ශන වාර්තාවෙන් නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) විමර්ශන වාර්තාව අනුව නීති කටයුතු කඩිනමින් සිදු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසුම් කරන ලද දිනය වූ 2014 පෙබරවාරි 10 වන විටත් නඩු නිමිත්ත කාලාවරෝධයට ලක්ව තිබුණු බව 2017 නොවැම්බර් 22 දිනැති නීතිපතිගේ ලිපිය අනුව දන්වා තිබුණි.

(iii) පාරිතෝෂික දීමනා පනතේ 23 වන වගන්තිය අනුව යම් නිලධාරියෙකුගෙන් යම් ආයතනයකට අය විය යුතු කිසියම් මුදලක් ඇත්නම් එම මුදල ගෙවන තෙක් පාරිතෝෂික මුදල් එකී ආයතනයේ රඳවා ගැනීමේ හැකියාවක් තිබියදී හා නීතිපති දෙපාර්තමේන්තුවේ ලිපියෙහි ද ඒ බව අවධාරණය කර තිබිය දී අය කර ගත හැකි මුදල් අය කර ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2013 මාර්තු 20 දින රු. 108,250 ක මුදලක් පාරිතෝෂික දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(iv) නීතිපති දෙපාර්තමේන්තුවේ උක්ත ලිපිය මගින් මෙම නිලධාරියා තවදුරටත් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ සේවයේ යෙදී සිටින බැවින් පරිපාලනමය වශයෙන් කටයුතු කර එකී මුදල් අයකර ගැනීමට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට හැකියාවක් ඇති බව අවධාරණය කර තිබුණ ද ඒ පිළිබඳව මෙතෙක් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය සඳහා රු. 800,000 ක් වැයකර 2015 වර්ෂයේ සකස් කරන ලද ආයතන සංග්‍රහය සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ ගුරු සහකාරවරයෙකු විශ්වවිද්‍යාලය වෙත අන්තර්ග්‍රහණය කිරීමේදී සිදුවූ අසාධාරණයක් හේතුවෙන් ඉල්ලා අස්වීමට ඉල්ලුම් කර තිබුණ ද, පශ්චාත් උපාධියක් හැදෑරීම සඳහා ලබාදුන් මුදල්වලට අදාලව රු. 4,684,315 ක් වූ බැඳුම්කරය ගෙවන තුරු ඉල්ලා අස්වීම පිළිගත නොහැකි බව දන්වා තිබුණි. කෙසේ වුව ද බැඳුම්කරය ආපසු ගෙවීමට නොහැකි වූ බැවින් නැවත සේවයට පැමිණ තිබුණ ද ඊට ඉඩ ලබා නොදීම හේතුවෙන් අදාල නිලධාරියා විසින් කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් පවරා තිබූ අතර 2017 අගෝස්තු 25 දිනැති නියෝගය අනුව නැවත සේවයේ පිහිටුවීමටත් වසර 02 ක හිඟ වැටුප් ගෙවීමටත් නියෝග කර තිබුණි. ඒ අනුව කළමනාකරණයේ දුර්වලතා හේතුවෙන් හිඟ වැටුප් ලෙස රු. 596,040 ක් හා නීති වියදම් ලෙස රු. 542,500 ක් වැය කිරීමට විශ්වවිද්‍යාලයට සිදුව තිබුණි.

(ඉ) **විශ්ව විද්‍යාල විද්‍යායතන සඳහා ප්‍රධාන විධායක නිලධාරීන් බඳවා ගැනීම**

(i) බටංගල සහ මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා ජාතික විශ්වවිද්‍යාල වෙතින් සප්තවාර්ෂික පදනම මත නිවාඩු ලබා පැමිණි නිලධාරීන් ප්‍රධාන විධායක නිලධාරීන් ලෙස බඳවාගෙන තිබූ අතර අවස්ථා 02 කදී ඔවුන් ස්ථිර සේවයේ නියුතු විශ්වවිද්‍යාල වෙතින් නිදහස් කරන ලද කාල සීමාවන් ඉක්මවා යන පරිදි පත්වීම් ලබා දී තිබුණි.

(ii) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී තනතුර දැරූ නිලධාරියා සප්ත වාර්ෂික නිවාඩු පදනම මත 2016 සැප්තැම්බර් 01 දින සිට බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස බඳවාගෙන තිබුණ ද ඔහු එම විශ්වවිද්‍යාලයෙන් නිදහස් කර තිබුනේ 2016 ඔක්තෝබර් 12 දින දීය. ඒ අනුව නිලධාරියෙකු ස්ථිර සේවා ස්ථානයේ සේවයෙන් නිදහස් කිරීමට පෙර පත්වීම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා වන 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 6.2 (අ) ඡේදය ප්‍රකාරව නියමිත කාලයට පෙර සේවය හැර ගියහොත් හෝ පහකරනු ලැබුවහොත් හැර අධ්‍යක්ෂවරයා සිය පත්වීම් දිනයේ සිට අවුරුදු 03 ක කාලපරිච්ඡේදය හෝ සිය හැටවන විය යන දෙකෙන් පළමුවැන්න සම්පූර්ණ කරන දිනය දක්වා සිය නිලය දැරිය යුතුය. කෙසේ වුවද බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය වෙත 2016 සැප්තැම්බර් 01 දින ප්‍රධාන විධායක නිලධාරී ලෙස බඳවා ගන්නා ලද නිලධාරී විද්‍යායතනයේ පත්වීම් කාලය අවසන් වීමට පෙර 2018 පෙබරවාරි 01 දින එනම් සප්තවාර්ෂික නිවාඩු අවසානයේ සේවයෙන් ඉවත්වී තිබුණි. ඒ අනුව අඛණ්ඩව සේවාවක් විද්‍යායතනවලට ලබාගත නොහැකි වීමෙන් පරිපාලන කටයුතු කාර්යක්ෂමතාවයකින් යුක්තව පවත්වාගෙන යන්නේ කෙසේ ද යන්න පිළිබඳව විගණනයේ දී ගැටළු සහගත විය.

**(ඊ) විශ්වවිද්‍යාලවල ක්‍රියාකාරිත්වය සඳහා පරිපාලන හා විගණක උපදේශකවරුන් පත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි කටයුතු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මාසිකව රු. 75,000 බැගින් විද්‍යායතන 04 ක් සඳහා පරිපාලන උපදේශකවරුන් 04 දෙනෙකු ද රු. 100,000 ක දීමනාවක් සහිතව විගණකවරයෙකු ද පිළිවෙලින් මාස 12 ක් හා මාස 06 ක් වූ කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ii) ඉහත බඳවාගත් නිලධාරීන් සඳහා බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබීම හේතුවෙන් පරිපාලන උපදේශකවරුන් 04 දෙනාගේ සහ විගණකගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට විගණනයේදී නොහැකිවිය.

(උ) විශ්වවිද්‍යාල කළමනාකරණ අධ්‍යයන අංශය වෙනුවෙන් විද්‍යාගාරයක් පිහිටුවීම සඳහා 2017 වර්ෂයේ මාර්තු 02 දින පරිගණක 46 ක් මිලදීගෙන තිබූ අතර රු. 5,841,172 ක් වටිනා පරිගණක හා උපාංග අරමුණෙන් බැහැරව වෙනත් අංශ වෙත නිකුත් කර තිබුණි.

(ඌ) විශ්වවිද්‍යාලයට අදාල සමාජ වගකීම් මොනවා ද යන්න නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල දී සමාජ වගකීම් යටතේ රු. 300,000 ක මුදලක් සුභසාධක සංගමයේ වාර්ෂික චාරිකාව වෙනුවෙන් වැය කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල මාස 3 ක් ඇතුළත නිකුත් කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර තිබුණද 2017 වර්ෂයේ පවත්වා ඇති විභාගවල පිළිතුරු පත්‍ර ඇගයීම සඳහා මාස 01 සිට මාස09 දක්වා වූ කාලයක් ගතවී තිබීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ප්‍රතිඵල නිකුත් කිරීමට නොහැකිවී තිබුණි. ප්‍රමාදයට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණු අතර ප්‍රමාද වලක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) **උපාධි පාඨමාලා සඳහා බාහිර දේශකයින් පත් කිරීම**

(i) විශ්වවිද්‍යාලය සති අන්ත උපාධි පාඨමාලා සඳහා සිසුන් වැඩි ප්‍රමාණයක් බඳවා ගෙන තිබුණද අභ්‍යන්තර දේශකවරුන්ගේ අධ්‍යයන වැඩ සැලසුම් හා කාලසටහන් අනුව සතියේ දිනවල පැවැත්වෙන උපාධි පාඨමාලා සඳහා වැඩි දේශණ පැය ප්‍රමාණයක් වෙන් කර තිබුණු බව නිරීක්ෂණය විය. අධ්‍යයන වැඩ සැලසුම් කිරීමේ දී ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර කථිකාචාර්යවරු 49 ක් සිටිය දී සමාලෝචිත වර්ෂය තුළ දී බාහිර දේශකවරුන් සඳහා රු. 18,642,743 ක් ගෙවීමට සිදුව තිබුණි. විස්තර පහත දැක්වේ.

| **පාඨමාලාව පවත්වන කාලය** | **උපාධි පාඨමාලා ගණන** | **බඳවාගෙන ඇති සිසුන් ගණන** | **දේශකයින්ට වෙන්කළ පැය ගණන** | |
|---|---|---|---|---|
| | | | අභ්‍යන්තර | බාහිර |
| සතියේ දින | 10 | 397 | 7662 | 4882 |
| සති අන්ත | 13 | 489 | 2244 | 10819 |

(ii) ඒ අනුව විශ්වවිද්‍යාලයේ 2017/2018 අධ්‍යයන වර්ෂයට අදාලව බඳවා ගන්නා ලද සිසුන් සඳහා පවත්වන ලද පදනම් වැඩසටහනේ (Foundation Programme) දේශන පැය 534 ක් හා 2014/ 2015, 2015/ 2016, 2016/ 2017 අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගත් සිසුන් වෙනුවෙන් දේශන පැය 17,674 ක් සඳහා බාහිර දේශකයින් වෙත පත්වීම ලබා දී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විශ්වවිද්‍යාලය සතු අධ්‍යක්ෂ ජනරාල් නිල නිවස 2012 නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණය කිරීමේදී සුදුසුකම් සපුරා නොතිබූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු දරන්නාට පෞද්ගලික වන සේ තනතුරුවල පිහිටුවා තිබුණි. කෙසේ වුව ද විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර 8 ක් ඉක්මගොස් තිබුණ ද එකී දරන්නාට පෞද්ගලික වන සේ තනතුරුවල පිහිටුවා තිබූ අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් 06 දෙනෙකු මෙතෙක් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2017 වර්ෂය තුළ බඳවා ගත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණියේ නිලධාරීන් 02 දෙනෙකුගේ හා කථිකාචාර්ය තනතුර සඳහා බඳවා ගත් නිලධාරියෙකුගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව තිබිය යුතු සුදුසුකම් තහවුරු කර ගැනීමට නොහැකි විය.

# 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

ඒ අනුව සංයුක්ත හා සමානාත්මතාවයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදාකරදීමත් 2030 වන විට ගුණාත්මක, කාර්මික වෘත්තීය සහ තෘතීය අධ්‍යාපනය සඳහා සියළුම කාන්තාවන් හා පිරිමින් සඳහා සමාන ප්‍රවේශයක් ඇති කිරීම තිරසාර සංවර්ධනය සම්බන්ධයෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අරමුණු ලඟා කරගැනීමේ ඉලක්ක ලෙස හඳුනාගෙන තිබුණ ද, විශ්වවිද්‍යාලය හරිත විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට කටයුතු කිරීම තිරසාර සංවර්ධන අරමුණු ලෙස හඳුනාගෙන තිබුණු බව විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණක, ආශ්‍රිත නිලධාරියකු හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ජ්/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 (2) (අ) (i) කෙරෙහි අවධානය යොමු කර විශ්වවිද්‍යාලයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, කාර්යසාධනය, ගිණුම්කරණ, මූල්‍ය හා මෙහෙයුම් අංශයන්හි අභ්‍යන්තර පාලන ඇගයීම් වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර, විශ්වවිද්‍යාලයේ පූර්ව විගණන කටයුතු සඳහා වැඩි කාලයක් යොදවා තිබූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 10 ක් පමණක් නිකුත් කර තිබුණි.

## 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 ඡේදයට පටහැනි ලෙස විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 02කදී රු.1,130,160ක භාණ්ඩ නැවත ඇණවුම් කර මිලදී ගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රසම්පාදනය සඳහා අවම වශයෙන් මිලගණන් 03ක් ලබාගතයුතු වුවද ඊට පටහැනිව එක් මිල කැඳවීමක් මත රු. 420,000 කට පුස්තකාල කළමනාකරණ මෘදුකාංගයක් මිලදීගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනය තරඟකාරීත්වයකට යොමුකර නොතිබුණු අතර එමගින් විශ්වවිද්‍යාලයට ලබා ගැනීමට තිබූ ආර්ථික වාසි අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. එසේම 2015 අප්‍රේල් 27 දින ලබාගත් මිල ගණන් මත පදනම්ව 2016 මැයි 25 දින මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණද එම කාලපරිච්ඡේදය තුළ තාක්ෂණික වෙනස්වීම්, මිල ගණන් වල වෙනස් වීම් හා ආයතනික අවශ්‍යතාවල වෙනස් වීම් පිළිබඳ කමිටුව විසින් අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) **වායු සමීකරණ යන්ත්‍ර 38ක් මිලදී ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වර්ෂය තුල රු. 10,510,000 ක් වැයකර විශ්වවිද්‍යාලයේ ඉදිකරනු ලබන ශබ්දාගාරයට සවි කිරීම සඳහා වායු සමීකරණ යන්ත්‍ර 38 ක් මිලදී ගෙන තිබූ අතර සැලසුමින් බැහැරව ඉන් යන්ත්‍ර 03 ක් උපකුලපති නිල නිවාසයේ සවිකර තිබුණි.

(ii) මිල ගණන් කැඳවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කර පිරිවිතර විශේෂීකරණයේ ඇතුළත් කරන ලද විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයෙන් බැහැරව තෝරාගත් සැපයුම්කරු ඉදිරිපත් කළ විශේෂීකරණ ලැයිස්තුවට අනුකූල වන අයුරින් තාක්ෂණික ඇගයීම් සඳහා පිරිවිතර වෙනස් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) තාක්ෂණික ඇගයීම් කමිටුව පිළියෙල කළ පිරිවිතරයන්හි ඇතුළත් පිරිවිතරයන්ගෙන් බැහැරව අවස්ථා 04කදී එකතුව රු. 13,805,838 ක් වූ නවීකරණය කිරීම් හා මිලදී ගැනීම් සිදුකර තිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ කාර්යභාරයන් නිසි ලෙස ඉටුවී නොතිබුණු අතර මිලදී ගත් අයිතමයේ හෝ සේවයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේ දී සෑහීමකට පත් විය නොහැකි විය.

**(ඉ) ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගැනීම**
**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 මැයි 12 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව ඡායා පිටපත් යන්ත්‍ර 2ක් එකක් රු. 153,000 ක් බැගින් වූ (බදු රහිත) මුදලකට යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම සඳහා නිර්දේශය කර තිබුණද මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 05 න් ආයතන දෙකක විශ්වවිද්‍යාලය සලකා බලන පිරිවිතරයන් සමඟ නොගැලපෙන බව දක්වමින් ඇගයීමට ලක් කර නොතිබුණි. ඒ අනුව අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් 2017 මැයි 22 වන දින ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් රු. 351,900 කට (බදු සහිතව) මිලදී ගෙන තිබුණු අතර එම ආයතනය ඉදිරිපත් කරන ලද ලංසු වලට අනුව ආයතනය විසින් මිල ගණන් ඉදිරිපත් කරන ලද යන්ත්‍ර වලට අදාල කොටස් ප්‍රතිස්ථාපන පිරිවැය හා පිටපත් ඒකකයක් සඳහා දරන පිරිවැය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව නිසි ඇගයීමක් කර නොතිබුණි.

(ii) ඡායා පිටපත් යන්ත්‍ර සඳහා ප්‍රසම්පාදිත ආයතනය විසින් ලබා දිය යුතු වන වසර 03 ක කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වන යන්ත්‍රයේ සේවා හා නඩත්තු වියදම් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව ඇගයීම් කර නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලය ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන්ට අදාල ගිවිසුම් කාලය අවසන් වී තිබූ අතර විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ අනුමැතියකින් තොරව, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් එම ගිවිසුම් කාලය දීර්ඝ කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
**----------------------------------------**

වෘත්තීය තාක්ෂණ, විශ්වවිද්‍යාලයේ බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකිරීම, ආයතනයේ ධාරිතාව වැඩි කිරීම, ඉගෙනුම් පරිසරය හා පශ්චාත් උපාධි පැවැත්වීම අරමුණු කර ගනිමින් ඉදිකිරීමට යෝජිතව තිබූ ඉගෙනුම් සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය ( Learning Resources Development Center) සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. මිලියන 260.26 ක් වැයකර තිබූ අතර මෙතෙක් ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. ඉදිකිරීම් අවසන් නොවූ ගොඩනැගිලි සංකීර්ණය වෙනුවෙන් රු. මිලියන 21.79 ක උපකරණ වර්ෂය තුල මිල දී ගෙන තිබූ අතර එම උපකරණ නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ උපකුලපතිගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා නොකිරීම |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) නිලධාරීන්ගේ සුදුසුකම් අදාල ආයතනවලින් /විශ්වවිද්‍යාලවලින් සනාථ කරවාගෙන නොතිබීම<br>(ii) බඳවාගැනීමේ පරිපාටිය අනුව කටයුතු නොකිරීම.<br>(iii) විදේශ පුහුණු සඳහා සහභාගීවන නිලධාරීන් වාර්තා ලබා නොදීම |
| (ඇ) වාහන පාලනය | අපහරණය කළ යුතු වාහන සම්බන්ධව චක්‍රලේඛ පරිදි කටයුතු නොකිරීම . |